# ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ
# කළමනාකරණ සහකාර අධි පන්තිය තාක්ෂණික නොවන සේවා ගණය
# සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

**01.** සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

යොමු අංකය : ජාලේ 7/1/8 දිනය : 2018.02.15

1.2 අමාත්‍යාංශය : අධ්‍යාපන අමාත්‍යාංශය

යොමු අංකය : ඊඩී/05/67/26/02/08 දිනය : 2018.03.02

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම

යොමු අංකය : DMS/1135 Vol – I දිනය : 2016.09.15

DMS/1135 Vol – I 2017.02.08

DMS/1135 Vol – I 2017.02.17

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය :

යොමු අංකය : EST-2/04/REC/10728 දිනය : 2018.04.27

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :

යොමු අංකය : NSCC/05/38/74/SR-III දිනය : 2018.03.22

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය:

යොමු අංකය : PSC/EST/02-01-08/01/2018 දිනය : 2018.06.14

**02.** පත්කිරීම් බලධරයා: රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**03.** සේවා ගණය පිළිබඳ විස්තර

**3.1** සේවා ගණය : කළමනාකරණ සහකාර අධිපන්තිය තාක්ෂණික නොවන

**3.2** ශ්‍රේණි : විශේෂ ශ්‍රේණිය

**3.3** පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :

අනුමත තනතුරු සංඛ්‍යාවට සීමා වන පරිදි අභ්‍යන්තර බඳවා ගැනීමේ ක්‍රියාවලියක් මඟින් බඳවා ගනු ලබන, ජ්‍යෙෂ්ඨ විධායක හා විධායක නිලධාරීන්ගේ කාර්යභාරයට පරිපූරක/ සුහසාධ්‍යකාරක/ උපස්ථම්භක වන පරිදි එම නිලධාරීන්ගේ අධීක්ෂණයට යටත්ව තනතුරු විශේෂිත කොට පවරා දෙනු ලබන පරිපාලනමය/ පිරිස් කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය සහ ලේඛන හා අධිලේඛන කළමනාකරණය සම්බන්ධ කාර්යයන් පැවරෙන සේවා ගණයකි.

**3.4** කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

**04.** තනතුරෙහි / තනතුරුවල ස්වභාවය: ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත

**05.** වැටුප්

**5.1** වැටුප් කේත අංකය : MN 7 - 2016



4

5.2 මාසික වැටුප් පරිමාණය : රු. 41,580 - 11 × 755 – 18 × 1,030 – රු. 68,425/=

5.3 ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ මාසික වැටුප් පියවර :

| ශ්‍රේණිය | අදාළ ආරම්භක වැටුප් පියවර | වැටුප (රු.) |
|---|---|---|
| විශේෂ | පියවර 5 | 44, 600/= |

වැටුප් ගෙවීම හා අදාළ අනෙකුත් කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධානයන්ට අනුකූලව විය යුතුය.

06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්:

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ ලේඛනාරක්ෂක | විශේෂ | 10 | සුරක්ෂිතාගාරවල ලේඛන පරිපාලනය, අධිලේඛන මුද්‍රණය කිරීම, අධිකරණ හමුවේ කරුණු දැක්වීම, ලේඛන ආබද්ධ කර ගැනීම හා ඒ සඳහා ක්‍රමෝපාය සැකසීම, මහජන විමසීම් හා පර්යේෂණ කාර්යය සඳහා සහාය වීම, ප්‍රදර්ශන, වැඩමුලු හා සම්මන්ත්‍රණ සංවිධානය හා මෙහෙයවීම, අර්ධ වෘත්තීය නිලධාරීන්ගේ සහ ලේඛනාරක්ෂක නිලධාරීන්ගේ වෘත්තීය රාජකාරි අධීක්ෂණය කිරීම සහ අධීක්ෂණ නිලධාරි හා ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන තනතුරට අදාළ අනෙකුත් කාර්යයන් |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 10

07. බඳවා ගැනීමේ ක්‍රමය :

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | - |
| සීමිත | 60% |
| කුසලතා | 40% |

<u>සටහන</u>

විශේෂ ශ්‍රේණියට බඳවා ගැනීමේ දී පුරප්පාඩු ගණනය කළ යුත්තේ ඊට පෙර වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ය.

පුරප්පාඩු සංඛ්‍යාව හතර (04) ක් සහ දෙක (02) ක් වන අවස්ථාවන්වල දී සීමිත හා කුසලතා ධාරාවන්ගෙන් ප්‍රතිශතය 50% බැගින් විය යුතු ය.

පුරප්පාඩු සංඛ්‍යාව තුන (03) ක් වන අවස්ථාවක දී සීමිත ධාරාව යටතේ පුරප්පාඩු දෙක (02)ක් හා කුසලතා ධාරාවෙන් පුරප්පාඩු එක (01) ක් බැගින් විය යුතු ය.

පුරප්පාඩු සංඛ්‍යාව එක (01) ක් වන අවස්ථාවක දී සීමිත ධාරාවෙන් පමණක් බඳවා ගත යුතු ය.
කුසලතා ධාරාව යටතේ සුදුසුකම් ලබන ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවල දී එම පුරප්පාඩු සංඛ්‍යාව සීමිත ධාරාවෙන් බඳවා ගනු ලැබේ.

7.2 විවෘත බඳවා ගැනීම : අදාළ නො වේ.

7.3 සීමිත බඳවා ගැනීම

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : විශේෂ ශ්‍රේණිය

7.3.2 සුදුසුකම්:

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් : අදාළ නො වේ.

7.3.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නො වේ.

7.3.2.3 පළපුරුද්ද : ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත සේවා ගණයේ ලේඛනාරක්ෂක නිලධාරී තනතුරක වසර පහ (05) කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියෙකු වීම (ලේඛනාරක්ෂක නිලධාරී ලෙස තනතුරු නාමය සංශෝධනය වීමට පෙර සේවා කාලය, අදාළ කර ගනු ලැබේ.)

7.3.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.2.5 වෙනත් :

I. පත්වීම ස්ථිර කර තිබිය යුතුය.
II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ ( 05) තුළ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
III. අදාළ තනතුරට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.
IV. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3.3 වයස : අදාළ නො වේ.

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත විභාගයක් මගින්

7.3.4.1 ලිඛිත විභාගය :

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01. අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| 02. කළමනාකරණය | පැය 03 | 100 | 40 |

(ඇමුණුම 01 හි දැක්වේ.)

7.3.4.1.1 පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නො වේ.

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු: සුදුසුකම් පරීක්ෂා කර බැලීම සඳහා පමණක් පවත්වනු ලබන අතර ලකුණු ලබා දෙනු නො ලැබේ.

7.3.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.3.4.4 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය : අදාළ නො වේ.

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : අභ්‍යන්තර නිවේදනයක් සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම

7.4.1 බඳවා ගන්නා ශ්‍රේණිය : විශේෂ ශ්‍රේණිය

7.4.2 සුදුසුකම්:

7.4.2.1 අධ්‍යාපන සුදුසුකම් : අදාළ නො වේ.

7.4.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නො වේ.

7.4.2.3 පළපුරුද්ද : ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත සේවා ගණයේ ලේඛනාරක්ෂක නිලධාරී තනතුරක I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම

7.4.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

7.4.2.5 වෙනත් :

I. පත්වීම ස්ථිර කර තිබිය යුතුය.
II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ ( 05) තුළ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
III. අදාළ තනතුරට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.
IV. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.4.3 වයස : අදාළ නො වේ.

7.4.4 බඳවා ගැනීමේ ක්‍රමය : යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

7.4.4.1 ලිඛිත විභාගය : අදාළ නො වේ.

7.4.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නො වේ.

7.4.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නො වේ.

7.4.4.4 යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අමතර සේවා පළපුරුද්ද | 60 | අදාළ නො වේ. |
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 15 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

සටහන :

1. ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, එක් එක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා වන විස්තරාත්මක ලකුණු පරිපාටිය ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර අනුමත කර ගැනීමෙන් පසු අයදුම්පත් කැඳවීමේ නිවේදනයට ඇතුලත් කර ප්‍රසිද්ධ කරනු ලැබේ.

2. ආශ්‍රිත සේවා ගණයේ ලේඛනාරක්ෂක නිලධාරී තනතුරක I ශ්‍රේණියේ සිටින නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් සිව් ගුණයක් යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

3. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව ජ්‍යෙෂ්ඨ ලේඛනාරක්ෂක තනතුරට උසස් කරනු ලැබේ.

7.4.4.4.1 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

08. කාර්යක්ෂමතා කඩඉම් : අදාළ නො වේ.

09. භාෂා ප්‍රවීණතාව : අදාළ නො වේ.

10. ශ්‍රේණි උසස් කිරීම : අදාළ නො වේ.

11. තනතුරුවලට පත් කිරීම : අදාළ නො වේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නාවූ කොන්දේසි : අදාළ නො වේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :

“සක්‍රීය සේවා කාලය” යනු, වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය යුතුයැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත්, නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය : අදාළ නො වේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර්කාලීන විධිවිධාන :

ජ්‍යෙෂ්ඨ ලේඛනාරක්ෂක තනතුර සඳහා කුසලතා ධාරාව යටතේ බඳවා ගනු ලබන පළමු අවස්ථාවේ දී ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/ කාර්යාලගත ඛණ්ඩය I සේවා ගණයේ සහකාර ලේඛනාරක්ෂක තනතුරේ වසර තුන (03) ක පළපුරුද්ද සහිතව දෙපාර්තමේන්තුගත තනතුරක වසර පහ (05)කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහ පූර්වාසන්න වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා 7.4.4.4 සඳහන් විධිවිධාන අනුව යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් පවත්වා එම නිලධාරීන් ජ්‍යෙෂ්ඨ ලේඛනාරක්ෂක තනතුරට උසස් කරනු ලැබේ.

---

| | | | |
|---|---|---|---|
| සකස් කළේ : | | පරීක්ෂා කළේ : | |
| අත්සන | : Nkumari | අත්සන | : |
| නම | : එච්.ජී.එන්.කේ. විජේසිංහ | නම | : බී.එම්. නිසංසලා බාලසූරිය |
| තනතුර | : කළමනාකරණ සහකාර III | තනතුර | : සහකාර අධ්‍යක්ෂ (පාලන) |
| දිනය | : 2018.07.18 | දිනය | : 2018.07.18 |

බී. එම්. නිසංසලා බාලසූරිය
සහකාර අධ්‍යක්ෂ (පාලන)
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව.
නො. 07, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

| | | | |
|---|---|---|---|
| නම | :ආචාර්ය නදීරා රූපසිංහ | | |
| තනතුර | :ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල් | | |
| දිනය | :2018.07.18 | නිල මුද්‍රාව | : |

---

යොමු අංකය :- ED/1.0/NH/03/07/02/06

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2018.06.14 දින අනුමැතිය පරිදි අංක PSC/EST/02-01-08/01/2018 දරන 2018.06.19 දිනැති ලිපිය මඟින් දන්වනු ලැබූ සංශෝධන අනුව සකස් කරන ලද ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර අධි පන්තිය තාක්ෂණික නොවන සේවා ගණය සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය සහතික කිරීම සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

අත්සන :

නම :

ජේ. ජේ. රත්නසිරි
ලේකම්
උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
8 වන මහල, සෙත්සිරිපාය
බත්තරමුල්ල.

ලේකම්,
උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

දිනය : 2018.08.08

නිල මුද්‍රාව :

යොමු අංකය - PSC/EST/02-01-08/01/2018

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර අධිපන්තිය තාක්ෂණික නොවන සේවා ගණය සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය 2018.06.14 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන ..............................................

නම සී. පී. ඩබ්ලිව්. ගුණතිලක

ලේකම් (වැ.බ)

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

සී. පී. ඩබ්. ගුණතිලක
වැඩ බලන ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය: 2018.09.13

නිල මුද්‍රාව:

01. විභාගයේ නම : ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර අධි පන්තිය තාක්ෂණික නොවන සේවා ගණයට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය

02. විභාගය පිළිබඳ විස්තර : ලිඛිත පරීක්ෂණයකි.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 1 | 100 | 40 |
| කළමනාකරණය | පැය 3 | 100 | 40 |

03. විභාගය පවත්වනු ලබන බලධරයා: විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. පවත්වන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : අවශ්‍යතාව පරිදි වසරකට වරක්

05. විභාගය සඳහා විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන ප්‍රශ්න වලින් සමන්විත වේ. |
| කළමනාකරණය | I. කළමනාකරණ මූලධර්ම<br>II. කළමනාකරණ පරිසරය<br>III. කළමනාකරණ ශ්‍රිතයන්<br>සැලසුම් කිරීම<br>තීරණ ගැනීම<br>සංවිධානය<br>මෙහෙයවීම<br>අභිප්‍රේරණය<br>නායකත්වය<br>පාලනය<br>IV. සහභාගීත්ව කළමනාකරණය<br>V. ගැටුම් කළමනාකරණය<br>VI. සිද්ධි අධ්‍යනය |

සකස් කළේ :
අත්සන :Nkumari
නම : එච්.ජී.එන්.කේ. විජේසිංහ
තනතුර : කළමනාකරණ සහකාර III
දිනය : 2018.07.18

පරීක්ෂා කළේ :
අත්සන :
නම : බී.එම්. නිසංසලා බාලසූරිය
තනතුර : සහකාර අධ්‍යක්ෂ (පාලන)
දිනය : 2018.07.18

බී. එම්. නිසංසලා බාලසූරිය
සහකාර අධ්‍යක්ෂ (පාලන)
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව,
නො. 07. පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම :ආචාර්ය නදීරා රූපසිංහ
තනතුර :ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්
දිනය :2018.07.18

නිල මුද්‍රාව :